# සාමාන්‍ය සමයේ විසිහයවන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

බාරුක් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

බාරුක් 4: 5-12, 27-29

"ඔබට විපත් පැමිණි වූ තැනැන් වහන්සේ ම සදා සතුට ඔබට දෙනු ඇත."

මාගේ සෙනඟෙනි, දිරි වඩන්න. ඔබ ඉශ්රායෙල් නාමය පණ ගන්වන අය වන්නහු ය.
විජාතීන්ට ඔබ විකුණනු ලැබුවහු ය. එහෙත්, එය ඔබේ වැනසීමට නොවේ.
ඔබ දෙවිඳුන් ප්‍රකෝප කළහු ය. එබැවින් හතුරන් අතට පාවා දෙනු ලැබුවහු ය.
දෙවිඳුන්ට නොව යකුන්ට පුද පඬුරු පිදීමෙන් ඔබ මැවුම්කරුවාණන් ප්‍රකෝප කළහු ය.
ඔබ තමන් ඇතිදැඩි කළ සදාතන දෙවිඳුන් අමතක කළහු ය.
ඔබට කිරි දුන් ජෙරුසලම් නගරයට ඔබ දුක් දුන්නහු ය. දේව උදහස ඔබ පිට වැටෙන විට, ඇය කතා කොට මෙසේ කීවා ය.
"සියොන් අසල්වැසියෙනි, සවන් දෙන්න. දෙවිඳාණෝ මහ දුකක් මා වෙත එවූ සේක.
සදාතන තැනැන් වහන්සේගේ තීන්දුව පරිදි වහල්කමට ගිය මාගේ දූ දරුවන් මම දිටිමි.
මම ඔවුන් ප්‍රීතියෙන් ඇතිදැඩි කළෙමි. දුකින් කඳුළු හෙළමින් ඔවුන් යන රඟ බලා සිටියෙමි.
ඔබෙන් කිසිවෙක් මා ගැන ප්‍රීති නොවන්න.
මම බොහෝ අය විසින් අහක දමනු ලැබූ වැන්දඹුවක්මි.

දේව නීතියෙන් අහක ගිය මාගේ ම දරුවන්ගේ පව් නිසා මම හුදකලා ව උ
ක් වෙමි.
මාගේ දරුවෙනි, දිරිමත් වන්න. දෙවිඳුන් අයදින්න.
ඔබට විපත් එවූ එතුම ඔබ සිහි කරනු ඇත.
ඔබේ කැමැත්තෙන්ම ඔබ දෙවිඳුන්ගෙන් ඈත් වී ගිය ලෙස දැන් ඉතින් ආපසු හැරී බොහෝ වැර වඩා එතුමන් සොයන්න.

මන්ද, එතුමන් ඔබට විපත් පැමිණ වූ සේ ම ඔබ මුදා සදා සතුට ඔබට දෙනු ඇත.

දේව වචනය මෙසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 69: 32 – 36

පිළිතුර: සමිඳාණෝ දිළිඳුන් හට සවන් දෙන සේක.

ගීය:

පීඩිතයෝ මෙය දැක ප්‍රීති ප්‍රමෝද වන්නෝ ය.
දෙවිඳුන් සොයා යන්නෝ දිරිමත් වන්නෝ ය. මන්ද, සමිඳාණෝ දිළිඳ
න් හට සවන් දෙන සේක. හිරගත වී සිටින තම සෙනඟ අත් නොහරින සේක.

අහසත්, පොළොවත් උන් වහන්සේට ප්‍රශංසා කරත්වා මුහුදත්, එහි හැසිරෙන සියල්ලෝත් එතුමන්ට ප්‍රශංසා කරත්වා
දෙවිඳාණෝ සියොන් කන්ද මුදාගෙන ජුදාගේ නගර ගොඩනගන සේක.

එතුමන් සෙනඟ එහි වසමින් එය භුක්ති විඳින්නෝ ය.

එතුමන්ගේ සේවක පෙළපත එය උරුම කරගන්නෝ ය.
දෙවි නමට පෙම් කරන්නෝ එහි වාසය කරන්නෝ ය.

## සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
ස්වර්ගයටත්, පොළොවටත් ස්වාමින් වන පියාණන් වහන්ස,
දේව රාජ්‍යය පිළිබඳ අබිරහස් හුදෙක් බාලයන්ට අනාවරණය කළ හෙයින් ඔබ වහන්සේට තුති වේවා!
ආලේලූයා!

## සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 10: 17-24

"ඔබගේ නම ස්වර්ගයෙහි ලියා ඇති නිසා සන්තෝෂ වන්න."

ජේසුස් වහන්සේ පිටත් කර යැවූ සැත්තෑ දෙනා ප්‍රීතියෙන් හැරී අවුත්, "ස්වාමිනි, ඔබගේ නාමයේ අනුහසින් යක්ෂයෝ පවා අපට අවනත වෙති" යි කීහ. උන්වහන්සේ ඔවුන්ට කතා කොට "සාතන් විදුලියක් මෙන් අහසින් වැටෙනු දුටිමු. බලන්න, සර්පයන් ද ගෝනුස්සන් ද පාගන්නටත්, සතුරාගේ මුළු ශක්තිය මැඩලන්නටත් මා ඔබට බලය පවරා ඇත. කිසිවකින් ඔබට අනතුරක් නොවෙයි. එසේ වුව ද අශුද්ධාත්මයන් ඔබට යටත් වන නිසා සන්තෝෂ නොවන්න. ඔබගේ නාම ස්වර්ගයෙහි ලියා ඇති නිසා සන්තෝෂ වන්නැ"යි වදාළ සේක.

ඒ පැයේදීම උන්වහන්සේ ශුද්ධාත්මයෙන් පූර්ණ වී උදන් අනමින් "ස්වර්ගයටත්, පොළොවටත් අධිපති වූ පියාණෙනි, ඔබ මේ දේවල් පැණවතුන් හා නැණවතුන් කෙරෙහි ආවරණය කොට බාලයන්ට අනාවරණය කළ බැවින් ඔබට තුති පුදමි. එසේය පියාණෙනි, ඔබට ප්‍රිය මනාප වූයේත් එයම ය. මාගේ පියාණන් වහන්සේ සියල්ලම මට පවරා දී තිබේ. පුත්‍රයාණෝ කවරෙක් දැයි පියාණන් වහන්සේ හැර අන් කිසිවෙක් නොදනිති. එසේම පුත්‍රයාණනුත්, පුත්‍රයාණන් විසින් පියාණන් වහන්සේ එළිදරව් කිරීමට තෝරාගනු ලැබූ අයත් හැර අන් කිසිවෙක් පියාණන් වහන්සේ කවරෙක් දැ යි නොදනිති"යි වදාළ සේක. එවිට උන්වහන්සේ ශ්‍රාවකයන් සමඟ තනිවම සිටිය දී ඔවුන්ට කතා කොට "ඔබ නරඹන දේ දකින ඇස් භාග්‍යවන්ත ය. මෙය මම ඔබට කියමි ඔබ දකින දේ දකින්නටත් අසන දේ අසන්නටත් බොහෝ දිවැසිවරයෝ ද රජවරු ද අපේක්ෂාවෙන් සිටියහ. එහෙත් ඔවුන් එය දුටුවේ වත් නැත. ඇසුවේ වත් නැතැ"යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.